**ජාතික මෝස්තර මධ්‍යස්ථානය - 2013**
**-----------------------------------------**

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1982 අංක 35 දරන ජාතික ශිල්ප සහා අනුබද්ධිත පනතේ 84(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ .

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ .

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂවලට අදාළව රු.751,823 ක් වූ උපචිත වියදම්, රු.893,220 ක් වූ ණයහිමි ශේෂ සහ රු.434,307 ක් වූ අවිනිශ්චිත ශේෂ ඇතුළු එකතුව රු. 2,079,398 ක් වූ බැර ශේෂ සහ රු.1,223,410 ක් වූ ණයගැති ශේෂ, රු.644,453 ක් වූ අත්තිකාරම් සහ රු.362,856 ක් ලැබිය යුතු මුදල් ඇතුළු එකතුව රු.2,230,700 ක් වූ හර ශේෂ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ප්‍රකාර අතීතයානුයෝගීව ව්‍යවහාර හෝ අතීතයානුයෝගීව නැවත ප්‍රකාශ කිරීම් අනුව ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂය අවසාන දිනට වූ සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

(ආ) වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ අවස්ථාවේ සිට වුව ද ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති මඟින් වත්කම මිල දී ගත් වර්ෂය සඳහා ක්ෂය නොකිරීම නිසා ක්ෂය ප්‍රතිපාදනය අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

ඉකුත් වර්ෂවලට අදාළ ගෙවිය යුතු විගණන ගාස්තු රු. 533,900 ක් හා සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**2.2.3 නොසැසඳූ පාලන ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් ගිණුම් විෂයයන් 04 කට අදාළව ගිණුම අනුව හා සත්‍යාපන වාර්තා අනුව රු.7,482,770 ක වෙනසක් වූ අතර එම වෙනසට හේතු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට සේවක ණය අරමුදල් ශේෂය හා කේවල ණය ගිණුම අතර රු.31,781 ක වෙනසක් අනාවරණය විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව, මෝටර් රථවල වටිනාකම රු.21,895,563 ක් ලෙස දක්වා තිබුණ ද, සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව එහි අගය රු.19,915,471 ක් වූයෙන් රු.1,080,092 ක වෙනසක් විය.

**2.2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එමින් තිබූ එකතුව රු.1,734,890 ක් වූ ණයගැති ශේෂ සහ එකතුව රු.1,103,346 ක් වූ ණයහිමි ශේෂ හඳුනා ගැනීමට නොහැකි ශේෂ සේ සලකා විධිමත් අධිකාරි බලයකින් තොරව සමාලෝචිත වර්ෂයේදී පොත්වලින් කපා හැර තිබුණි.

**2.3. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ගිණුම්වල එකතුව රු.6,532,740 ක් වූ අතර ඉන් රු.233,255 ක් වසර 05 ඉක්ම වූ ණය ශේෂ විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මධ්‍යස්ථානයේ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ගිණුම්වල එකතුව රු.505,398 ක් වූ අතර ඉන් රු.290,398 ක් වසර 05 ඉක්ම වූ ණය ශේෂ විය.

**2.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIVපරිච්ඡේදයේ 28 වගන්තිය | රාජකාරි ගමන් අවසන් කර දින 30 ක් ඇතුළත දී ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර ගමන් වියදම් ප්‍රතිපූර්ණය කර ගත යුතු අතර, එසේ නොවන ඉල්ලුම්පත් සඳහා අධිහාර පැනවිය යුතු වුවත් එය නොසලකා කාලය මාස 03 ඉකුත්ව ගිය එකතුව රු.12,379 ක් වූ ගමන් වියදම් ඉල්ලුම්පත් සඳහා විශේෂ අවස්ථාවක් සේ සලකා අධිහාර අය කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 396 | තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ එකතුව රු.5,286 ක් වූ චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | රු.19,842,682 ක් වූ ගොඩනැගිලි සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, මධ්‍යස්ථානයේ සමස්ත වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.3,157,429 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.6,513,683 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,671,112 ක වර්ධනයක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව භාණ්ඩාගාරයෙන් ලද පුනරාවර්තන ප්‍රදාන රු.5,348,200 කින් ද ප්‍රාග්ධන ප්‍රදාන රු.2,172,637 කින් ද වැඩි වීම මෙම මූල්‍ය ප්‍රතිඵලයේ වාසිදායක වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානයට අයත් මෝස්තරකරුවන් 10 දෙනෙකු සිටින අතර, එක් නිර්මාණකරුවෙකු මාසයක දී අවම වශයෙන් මෝස්තර 05 ක් නිර්මාණය කළයුතු බවට ඉලක්කයන් ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ නිර්මාණ 705 ක් නිමකර තිබූ අතර එයින් 507 ක් වැඩහල වෙතද 198 ක් බාහිර ශිල්පීන් වෙත ද ලබා දී තිබුණි. මෙම නිර්මාණ, ශිල්පීන් අතර ප්‍රචලිත කිරීම හෝ ජනප්‍රිය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර තිබූ බවට, පසුවිපරම් කිරීම සඳහා ක්‍රමවේදයන් හඳුන්වා දී නොතිබුණු අතර නව මෝස්තර වලින් රටට ලැබෙන ඵලදායිතාවයේ ප්‍රමාණය මැනීම ගැටළු සහගත වී තිබුණි.

(ආ) භෞතික ප්‍රගතිය

සමාලෝචිත වර්ෂයේ මධ්‍යස්ථානය විසින් පැවැත්වීමට යෝජිතව තිබූ පාඨමාලා 03 න් 02 ක්ම පවත්වා නොතිබුණි. නව මෝස්තර සඳහා වෙළඳපොල පහසුකම් ලබා දීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ නව නිර්මාණ ඉලක්ක ගත ප්‍රමාණයෙන් සපුරා තිබුණේ සියයට 58 ක් පමණ වූ අතර ප්‍රදර්ශනය කිරීමට සැළසුම් කළ අත්කම් නිර්මාණ සහ නිර්මාණ ශිල්පීන් ඉදිරිපත් කළ නොහැකිව තිබුණි. සැපයීමට අපේක්ෂිත මෝස්තර උපදේශක සේවා වලින් ඉලක්ක සපුරා තිබුණේ සියයට 50 ක් පමණි. මේ අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව, ඉලක්ක කර තිබූ මුළු වැඩසටහන් 05 න් වැඩසටහන් 03 කින් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට අසමත් වී තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නව ප්‍රදර්ශනාගාරය - බත්තරමුල්ල

ක්‍රියාකාරී සැලැස්මට අනුව, නව මෝස්තර ප්‍රචලිත කිරීම එම මධ්‍යස්ථානයේ මූලික අරමුණක් වුවද, බත්තරමුල්ල ප්‍රදර්ශනාගාරය රු.2,883,627 ක් වැයකර 2011 නොවැම්බර් 28 දින ආරම්භ කර තිබුණි. ඉකුත් වර්ෂයේ සිට ප්‍රදර්ශනාගාරය වසාදමා තිබීම හේතුවෙන් 2011 වර්ෂයේ දී පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණු රු.998,400 ක භාණ්ඩ හා නත්තරම්පොත ශාඛාවෙන් එවන ලද රු.250,024 ක් වටිනා ආදර්ශ මෝස්තර භාණ්ඩ

(Samples) 338 ක් ප්‍රදර්ශනාගාරය වසා දැමීමෙන් පසුව ප්‍රධාන කාර්යාලයේ තැනින් තැන දමා තිබුණි. ඒ අනුව 2014 මැයි 30 දින වන විටත් මෙම භාණ්ඩ ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණු අතර බලාපොරොත්තු වූ අරමුණු ඉටුකරගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) දිවි නැගුම ජාතික ව්‍යාපෘතිය යටතේ කුකුල් කූඩු නිෂ්පාදනය
---------------------------------------------------------------------
ආයතනයේ අරමුණුවලට පටහැනිව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් අනුව, මහනුවර පදිංචි සැපයුම්කරුවකු සමඟ රු. 2,074,474 ක් වටිනා ආදර්ශ කුකුල් කූඩු 67 ක් ඉදිකර සපයා දීමට ගිවිසුමක් අත්සන් කර තිබුණි. ඒ අනුව ආදර්ශ කුකුල් කූඩු 15 ක් ඉදිකර තිබූ අතර, එම කූඩු 15 භාර ගැනීමට මධ්‍යස්ථානය කටයුතු නොකිරීම නිසා රු.3,621,895 ක පාඩුවක් කොන්ත්‍රාත්කරුට සිදුවී ඇති බවත් ඒ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියා මාර්ග ගන්නා බවත් දන්වා එන්තර වාසියක් මධ්‍යස්ථානය වෙත එවා තිබුණි.

### 4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
------------------------------------------------
පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානය හා ලංකා සංචාරක මණ්ඩලය එක්ව රු.68,470,615 ක් වැයකර නත්තරම්පොත කලාපුර ගම්මානයේ පොදු පහසුකම් මධ්‍යස්ථානයක් හා ගිමන්හලක් ඉදිකර ඒ සඳහා යන්ත්‍ර මිලදී ගෙන ශිල්ප සමිතියකට භාර දී තිබුණ ද, වසර 04 ක කාලයක සිට ඒවා ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව තිබුණි.

(ආ) කලාපුර ගම්මානයේ පොදු පහසුකම් මධ්‍යස්ථානයේ රථගාල, ක්‍රීඩාංගනය හා පැතිබැම්ම ඉදිකිරීම සඳහා රු.1,008,576 ක මුදලක් වැයකර තිබුණද එය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රීයව තිබුණි. රථගාල හා ක්‍රීඩාංගනය අසල ඉදිකර තිබූ පැතිබැම්මේ අඩි 20 ක් පමණ ප්‍රමාණයක් කැඩීගොස් වසර හතරක කාලයක් ගත වී තිබුණද එය යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නත්තරම්පොත ශාඛාවේ රසායනාගාරය භාරව නිළධාරියෙකු පත්කර නොමැතිකමින් රු.145,089 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 79 ක් හා රු.47,074 ක් වටිනා රසායන ද්‍රව්‍ය වර්ග 48 ක් 2010 වසර ආරම්භයේ සිට 2013 වසර අවසන් වන විටත් නිෂ්ක්‍රීයව තිබුණි.

### 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය
------------------------------
මධ්‍යස්ථානයේ 2013 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේදී අතිරික්ත සේවක සංඛ්‍යාව 05 ක් හා පුරප්පාඩු 36 ක් වූ අතර එම පුරප්පාඩු පුරවා ගැනීමට මධ්‍යස්ථානය අපොහොසත් වී තිබුණි. අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන ආදේශ නොකළ සේවකයන් 06 දෙනෙකු සේවයේ යොදවාගෙන ඔවුන්ට සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් හා දීමනා ලෙස රු.1,930,500 ක් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
---------------------------------------------

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම
--------------------
සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර තිබුණද ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාර ඉලක්කගත පුහුණු වැඩසටහන් කිහිපයක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

**--------------------------------**

අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 12 සිට සියයට 100 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලන**

**------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර මධ්‍යස්ථානයේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) මූල්‍ය පාලනය